25

# පාල හා සේන යුගයන්ට අයත් බුද්ධ ප්‍රතිමාවල මහායාන බෞද්ධාගමික ලක්ෂණ

*කේ. එම්. යූ. කෞශල්‍යා* [1]
HU/2012/0351

ක්‍රි.ව. 730 සිට ක්‍රි.ව. 1197 දක්වා කාලයේදී ඉන්දියාවේ බිහාරය, බෙංගාලය, නාලන්දා ආදී ප්‍රදේශයන්හි ස්ථාපිත වූ බුද්ධ ප්‍රතිමාවල දැකිය හැකි මහායානික බෞද්ධාගමික බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි අරමුණවේ. බුද්ධ ප්‍රතිමා නිර්මාණකරණය පිළිබඳ බොහෝ විද්වතුන් සිය අවධානය යොමුකර තිබුණ ද පාල සේන යුගයේ බුද්ධ ප්‍රතිමා සඳහා ලැබී තිබූ මහායානික ලක්ෂණ පිළිබඳ පර්යේෂණ කර නොතිබීම කැපී පෙනෙන ලක්ෂණයකි. මෙම කාල පරිච්ඡේදයේදී නාලන්දාව කේන්ද්‍රකර ගත් පාලනය ගෙනයනු ලැබුවේ පාල හා සේන රාජවංශිකයන්ය. ඉන්දියාවෙන් නිර්මල බුදුදහම විනාශ වී යාමත් සමඟම මහායාන දර්ශනයෙන් බුදුදහම පෝෂණය වීමත් සමඟ බුද්ධ ප්‍රතිමා නිර්මාණයට ද එහි ආභාසය ලැබුණි. ඒ අනුව වෛරෝචන, අක්ෂෝභ්‍ය, අමිතාභ, අමෝඝසිද්ධි හා රත්නසම්භව යන බුදුවරුන්ගෙන් සමන්විත බුද්ධ මණ්ඩල සංකල්පය අනුව බුද්ධ ප්‍රතිමා නිර්මාණය සිදු කෙරිණි. අවලෝකිතේශ්වර, මෛත්‍රීය ආදී බෝධිසත්ත්වයන් ඇදහීම මහායානයේ පැවති අතර එම ලක්ෂණ ද මෙම යුගයේ බුද්ධ ප්‍රතිමාවලින් පැහැදිලි වේ. මහායානය ලෞකිකත්වයට නැඹුරු වූ දර්ශනයක් වීම නිසා මෙකල බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීමේදී බුදුන් වහන්සේගේ ආධ්‍යාත්මික ගුණාංග දැක්වීමට වඩා බාහිර අලංකරණයට ප්‍රධාන ස්ථානයක්දී ඇති බව ගම්‍ය වේ. බුද්ධ ප්‍රතිමාවල අත්ලෙහි පද්ම සංකේත දැක්වීමෙන් ද, බුද්ධ ශීර්ෂ ඔටුනුවලින් අලංකාර කිරීමෙන් ද එම ප්‍රතිමාවල මහායානික ලක්ෂණ දෘශ්‍යමාන වේ. තවද වජ්‍රයානය අනුව බුදුවරුන්ට ශක්තීන් හෙවත් භාර්යාවන් නිර්මාණය කෙරුණි. බුදුවරුන්ගේ විවිධ ගුණාංග දැක්වීමට මෙලෙස ශක්තීන් නිර්මාණය කර ගනු ලැබිණි. එනම් බුදුන්ගේ කරුණාව පෙන්වා දීමේදී ප්‍රඥා පාරමිතාව දක්වා ඇති අතර තාරා දෙවඟන ද බුද්ධ ප්‍රතිමා නිර්මාණයේදී යොදාගෙන ඇත. මෙහිදී ද්විතියික මූලාශ්‍ර වශයෙන් තේමාව හා සබැඳි ග්‍රන්ථ ද සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය වැනි සූත්‍ර ද තෘතියික මූලාශ්‍රය අන්තර්ජාලය ද යොදා ගනු ලැබිණි. මෙලෙස සකස් කර ගත් දත්ත විශ්ලේෂණය කිරීමේදී පාල හා සේන යුගයේ ව්‍යාප්ත වූ මහායාන හා තන්ත්‍රයාන බෞද්ධාගම මෙකල බුද්ධ ප්‍රතිමාවලට ද සුවිශේෂී බලපෑමක් කර ඇති බව හඳුනාගත හැකි ය.

ප්‍රමුඛ පදඃ පාල සේන යුගය, මහායාන බුද්ධ ප්‍රතිමා, තන්ත්‍රයානය, සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, ශක්ති වන්දනාව

*1 දෘශ්‍ය කලා සහ සැලසුම්කරණය (විශේෂවේදී) දෙවැනි වසර*